| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My Ref. | CSS/7/13/2/1-VOL 01 | ඔබේ අංකය<br>உமது இல.<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2022.08. 30 |

දකුණු පළාතේ සියළුම

ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් හා

ගණන් දීමේ නිලධාරීන් වෙත,

**උපරිමාධිකරණ විනිශ්චයකාරවරුන්, අධිකරණ සේවා කොමිෂන් සභාව හා අධිකරණ නිලධාරීන් සමග ලිපි ගනුදෙනු සිදුකිරීම**

උක්ත කරුණ සම්බන්ධයෙන් ජනාධිපති ලේකම් විසින් 2022.08.15 දිනැතිව නිකුත් කර ඇති අංක PS/SB/Circular/11/2022 දරන චක්‍රලේඛය සම්බන්ධයෙනි. (චක්‍රලේඛ පිටපතක් මේ සමග අමුණා ඇත)

02. රාජ්‍ය නිලධාරීන් විසින්, ගරු අග්‍රවිනිශ්චයකාරතුමා ඇතුළු උපරිමාධිකරණ විනිශ්චයකාරවරුන්, අධිකරණ සේවා කොමිෂන් සභාව හෝ අධිකරණ නිලධාරීන් (මහාධිකරණ විනිසුරුවරුන්, දිසා විනිසුරුවරුන් හා මහේස්ත්‍රාත්වරුන්) සමග සෘජුව ලිපි ගනුදෙනු සිදුකිරීමෙන් වැළකී සිටිය යුතු බව ඇතුළු කරුණු කිහිපයක් සම්බන්ධයෙන් මෙයින් අවධාරණය කොට ඇත.

03. ඒ අනුව ශීර්ෂගත කරුණු ප්‍රකාර කටයුතු කිරීමේදී එම චක්‍රලේඛය මගින් නියම කොට ඇති පරිදි කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

ආර්.සී. ද සොයිසා,

ප්‍රධාන ලේකම් ,

දකුණු පළාත.

ජනාධිපති කාර්යාලය
சனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT

මගේ අංකය: PS/SB/Circular(2022)/02
2022 අගෝස්තු මස 15 දින

චක්‍රලේඛ අංකය: PS/SB/Circular/11/2022

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානින් / දිස්ත්‍රික් ලේකම්වරුන්,
රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්,

**උපරිමාධිකරණ විනිශ්චයකාරවරුන්, අධිකරණ සේවා කොමිෂන් සභාව හා අධිකරණ නිලධාරීන් සමග ලිපි ගනුදෙනු සිදුකිරීම**

රජය හෝ රාජ්‍ය නිලධාරීන් පාර්ශවකරුවන් වන අධිකරණ කටයුතු හෝ ඊට ආනුෂංගික කරුණු සම්බන්ධයෙන් අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන් හෝ ඊට පහළ මට්ටමේ නිලධරයින් විසින් කිසිදු අවස්ථාවක ගරු අග්‍රවිනිශ්චයකාරතුමා ඇතුළු උපරිමාධිකරණ විනිශ්චයකාරවරුන්, අධිකරණ සේවා කොමිෂන් සභාව හෝ අධිකරණ නිලධාරීන් (මහාධිකරණ විනිසුරුවරුන්, දිසා විනිසුරුවරුන් හා මහෙස්ත්‍රාත්වරුන්) සමග ඍජුව ලිපි ගනුදෙනු සිදුකිරීමෙන් වැළකී සිටිය යුතු අතර, එම කරුණු සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXVII වන පරිච්ඡේදයේ විධිවිධාන හා ඊට අදාළ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ උපදෙස් පරිදි නීතිපති දෙපාර්තමේන්තුව සමග පමණක් ලිපි ගනුදෙනු සිදුකිරීමට වගබලාගත යුතුය.

ඉහත කරුණුවලට පරිබාහිර කරුණු සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුව සමග ලිපි ගනුදෙනු සිදුකරන්නේ නම්, එම ලිපි ගනුදෙනු ජනාධිපති කාර්යාලය හරහා පමණක් සිදුකළ යුතු වේ.

අධිකරණ අමාත්‍යාංශය හෝ වෙනත් රාජ්‍ය ආයතන විසින් තම විෂය පථයට අදාළව එදිනෙදා සාමාන්‍ය පරිපාලන කටයුතු සම්බන්ධයෙන් අධිකරණ සේවා කොමිෂන් සභාව, නීතිපති දෙපාර්තමේන්තුව හා අධිකරණ නිලධාරීන් සමග සිදු කරනු ලබන ලිපි ගනුදෙනු සම්බන්ධයෙන් හා අධිකරණ නිලධාරීන් සම්බන්ධව අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන පැමිණිලි සම්බන්ධයෙන් මෙම චක්‍රලේඛ විධිවිධාන අදාළ නොවන බව සැළකිය යුතුය.

ඊ එම් එස් බී ඒකනායක
ජනාධිපති ලේකම්

පිටපත්
(1). අග්‍රාමාත්‍ය ලේකම්
(2). අමාත්‍ය මණ්ඩල ලේකම්
(3). විගණකාධිපති